නිපුණතාව 10 වී වගාව

10.4 වී වගාවට අවශ්‍ය පාරිසරික සාධක

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි බෝගය වන්නේ වී වගාවයි.නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කිහිපයක හැර ලංකාවේ අනෙකුත් බොහෝ ප්‍රදේශ වල බහුලව වී වගා කරන අතර ඒ සඳහා යෝග්‍ය පාරිසරික හා පාංශු සාධක පැවතීම ලාංකිකයන් වන අපගේ භාග්‍යයකි.

1. වී වගාව සඳහා බලපාන ප්‍රධාන පාරිසරික සාධක හතරක් ලියන්න.

2. සර්ම කලාපීය රටක් වන ශ්‍රී ලංකාවට වී වගාව යෝග්‍ය වීමට හේතු 03 ක් ලියන්න.

3. පහත රට තෙත් කලාපයේ වී වගාවට බලපාන පසේ අහිතකර තත්ත්ව තුනක් ලියන්න.

4 .පසු කාලීනව ඇති වූ වී පර්යේෂණ ආයතන එම ගැටලු වලට හඳුන්වා දුන් නව වී වර්ග කිහිපයක් උදාහරණ ලෙස දක්වන්න.

5.ශ්‍රී ලංකාවේ බහුලව වී වගා කරන ප්‍රදේශ සිතියමක ලකුණු කරන්න.

6. පෙළ පොත පිටු අංක 177 කියවා හිස්තැන් පුරවන්න.

වී වගාව සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ..... පසක් වන අතර බොහෝ විට ගංගා නිම්නවල ඇති දියළු පසේ වී වගාව සර්ථකව වගා කළ හැකිය. වී වගාවට බලපාන ප්‍රධාන සීමාකාරී සාධකය ..... යි. හෙක්ටයාරයක බිම් ප්‍රමාණයක් සඳහා එක් කන්නයකට ජලය .....අවශ්‍ය වේ.මෙය ..... හා ..... වෙනස් වේ. දුර්වල ජලවහනය නිසා ..... හා..... වැනි තත්ත්ව දැකිය හැකි ප්‍රදේශ ලෙස තෙත් කලාපයේ ..... හා ..... පළාත් වල සමහර ප්‍රදේශ හඳුනාගත හැකිය.සමහර වී ප්‍රභේද වල පුෂ්පීකරණය, ... හා ..... සඳහා ..... බලපායි. කෙටි දිවා වී ප්‍රභේද වගා කිරීම සඳහා ..... කන්නය සුදුසුය. ..... වී වගාවට ගැළපෙන උෂ්ණත්ව පරාසය වන්නේ ..... යි.